HUMAN RIGHTS WATCH

# යලි උපදින භීෂණය : ශ්‍රී ලංකාවේ "අතුරුදහන්වීම්" සහ පැහැරගැනීම්වලට රාජ්‍යයේ වගකීම

## සාරාංශය

2006 මැද භාගයේදී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර ප්‍රබල යුධ ගැටුම් යලි ආරම්භවීමත් සමගම අතීතයේදී දක්නට ලැබුනු භයානක සංසිද්ධියක්වන යුධවැදී සිටින පාර්ශවයන් විසින් තරුණයන් බලහත්කාරයෙන් පැහැරගෙන යාම සහ ඔවුන් "අතුරුදහන්කරවීම" යලිත් කරලියට පැමිණ තිබේ. 2002 දී නෝර්වේ රාජ්‍යයේ මැදිහත්වීමෙන් අත්සන් තබන ලද සටන්විරාමය නිලනොවන වශයෙන් ක්‍රියාවිරහිතවී යාමෙන් සහ 2008 ජනවාරි මාසයේදී එම සටන් විරාමය නිලවශයෙන් අවලංගුකිරීමෙත් අනතුරුව, ඉදිරි වසර ඇතුලත යුධ ගැටුම් බොහෝදුරට උත්සන්න විය හැකිය. තරුණයන් අතුරුදහන් වීමේ සිදුවීම් නැවැත්වීමටත්, මෙතෙක් අතුරුදහන්වූවන්ට සිදුවූදේ සොයාබැලීමට සහ එම අතුරුදහන්වීම්වලට වගකිවයුත්තන්ට දඬුවම් පැමිණවීමට ශ්‍රී ලංකා ආණ්ඩුව තීරණාත්මක පියවර නොගතහොත් 2008 වසර ඇතුලත ”අතුරුදහන්වීම්” සීග්‍රයෙන් වර්ධනය වීමට ඉඩ තිබේ.

2006 සිට පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන්කරවීමේ (enforced disappearances) සිදුවීම් සියගණනක් වාර්තාවීමත් සමගම ලොවපුරා පුද්ගලයන් වැඩියෙන්ම අතුරුදහන්වීම් අලුතෙන් වාර්තාවන රටවල් අතර ශ්‍රී ලංකාවට ප්‍රමුඛ ස්ථානයක් හිමිවේ. මේ ඉරණමට ගොදුරුවන අයගෙන් බහුතරය දෙමළ ජාතික තරුණයන් වන අතර, ඔවුන් බොහෝවිට "අතුරුදහන්වන්නේ" ආණ්ඩුවේ ආරක්ෂක හමුදා විසින් උතුරු නැගෙනහිරදී අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුවය. එමතු නොව, කොළඹ අගනුවරදීද දෙමළ ජාතික තරුණයන් මේ ඉරණමට මුහුණදෙති. මේ තරුණයන්ගෙන් ඇතැමෙකු එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් හෝ ආධාරකරුවන් වියහැකි නමුත්, අදාල නීතිමය ක්‍රියාදාමයෙන් පරිබාහිරව හෝ රහසිගතව ඔවුන් රඳවා තබාගැනීම එයින් සාධාරණීකරණය නොකෙරේ. මේ තරුණයන් අතරින් බොහෝදෙනා දැනටමත් මියගොස් ඇතිබව විශ්වාස කෙරේ.

මේ අර්බුදය හමුවේ, මෙම අතුරුදහන්කරවීම්වලට වගකිවයුත්තන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා ඔවුන් අධිකරණය ඉදිරියට පැමිණවීමට ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රබල උනන්දුවක් නොදක්වයි. හියුමන් රයිට්ස් වොච් සංවිධානයට මුණගැසුනු තම ඥාතීන් අතුරුදහන්වූ සියලුම

පවුල්වල සාමාජිකයන් කියාසිටියේ එම අතුරුදහන්වීම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා ශ්‍රී ලංකා බලධාරීන් උනන්දු කිරීමට ඔවුන් දැරූ සියලු උත්සාහයන් අසාර්ථක වූ බවයි.

මෙම අසාර්ථකභාවය මගින් ඇතිකෙරෙන බලපෑම මිණිය නොහැකි තරම් බරපතලය. වධබන්ධනවලට ලක්වුවන් හෝ අහිමිවූ ජීවිත මතු නොව, "අතුරුදහන්වූ" තම ඥාතියාට අත්වූ ඉරණම ඇතැම්විට කිසිදිනෙක දැනගැනීමට නොලැබෙන ඔවුන්ගේ බිරින්දෑන්, දෙමාපියන් සහ දූදරුවන්ගේ වේදනාව විසින් සමාජ දේහයට එල්ලකරන්නේ විශාල බලපෑමකි. කිසිදින කිසිවෙකු දඬුවම් නොලබන මෙවැනි භයංකර අපරාධ සිදුවන සමාජයන්හි පැතිරයන බිය සහ නොසන්සුන් මානසිකත්වයද කාලාන්තරයක් මුලුල්ලේ එම සමාජයන්හි රඳා පවතී.

2006 මැද භාගයේ සිට සිදුකරනලද අතුරුදහන්වීම් සම්බන්ධයෙන් පවත්වන ලද පූර්ණ සමීක්ෂණයකින් හෙළිවූ කරුණු මෙම වාර්තාවට ඇතුලත්වේ. ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් මේ දක්වාම දක්වන ලද ඇල්මැරුණු ප්‍රතිචාරය පිලිබඳ සවිස්තර වාර්තාවක්ද එයට ඇතුලත්ය. පරීක්ෂණ පැවැත්වීමට අපොහොසත්වීමේ පසුගිය ආණ්ඩුවල සියලුම අසාර්ථකභාවයන් මෙම ආණ්ඩුවද ප්‍රදර්ශණය කරයි. "අතුරුදහන්වීම්" පිලිබඳව පරීක්ෂණ කිරීම සඳහා විවිධ යාන්ත්‍රනයන් පිහිටුවීම වැනි කටයුතු සම්බන්ධයෙන් බොහෝ ඝෝෂා පැවැත්වෙන නමුත්, සත්‍යය සොයාගැනීම සඳහා ප්‍රබල උත්සාහයක් නොදැරෙන අතර, මෙම සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයන් නීතිය ඉදිරියට පැමිණවීමක්ද නොකෙරෙන තරම්ය. බළධාරීන් සහ තත්ත්වය පිලිබඳව ප්‍රබල අවධානයෙන් සිටින ජාත්‍යන්තර ප්‍රජාවට වඩාත් කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්විය හැක්කේ කෙසේද යන්න සම්බන්ධයෙන් වාර්තාව අවසානයේ විශේෂ නිර්දේශ ඉදිරිපත් කෙරේ. හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් පවත්වනලද සමීක්ෂණ ඇසුරෙන් සකස්කෙරුණු සිදුවීම් 99ක් පිලිබඳ සවිස්තර වාර්තාද ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවිධාන විසින් ලැයිස්තුගත කරන ලද අතිරේක සිදුවීම් 498ක් පිලිබඳ තොරතුරුද මෙම වාර්තාවේ ඇමුණුමට ඇතුලත්වේ. http://hrw.org/reports/2008/srilanka0308/srilanka0308cases.pdf වෙබ් අඩවියේ මෙම විස්තර දක්නට ඇත.

* * * *

ජාත්‍යන්තර නීතියට අනුව, රාජ්‍යයේ බළධාරීන් විසින් පුද්ගලයෙකු රඳවාගෙන, රඳවාගත්බව පිලිනොගැනීම හෝ ඔහු සිටින ස්ථානයක් දැනුම්දීම ප්‍රතික්ෂේප කිරීම මගින් එම පුද්ගලයාට නීතියේ රැකවරණය අහිමිකරන අවස්ථාවක, බලහත්කාරයෙන් අතුරුදහන්කිරීමක් සිදුවිය හැක.

ශ්‍රී ලංකාවේදී, "අතුරුදහන්කරවීම" කාලාන්තරයක් මුලුල්ලේම සන්නද්ධ ගැටුම් සමඟ බැඳී පවතී. 1987 සිට 1990 දක්වා වාමාංශික සිංහල ජාතිකවාදී ජනතා විමුක්ති පෙරමුන විසින් දියත්කරන ලද කෙටිකාලීන එහෙත් ඉතා ප්‍රචණ්ඩ කැරලිකාරී සමයේදී සහ ආණ්ඩුව සහ

දෙමළ ජාතිකවාදී එල්ටීටීඊ සංවිධානය අතර දශක දෙකකට ආසන්න කාලයක් මුළුල්ලේ පවතින සිවිල් යුද්ධයේදී දසදහස් සංඛ්‍යාත පිරිසක් අතුරුදන්කරවීමට ආණ්ඩුවේ ආරක්ෂක හමුදා වගකිවයුතු බව විශ්වාස කෙරේ.

බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම යලිත් වරක් මේ යුධ ගැටුමේ ප්‍රධාන සාධකයක් බවට පත්වී තිබේ. ආණ්ඩුව සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් නිකුත්කරන ලද සංඛ්‍යාලේඛනවල දැක්වෙන පරිදි, 2005 දෙසැම්බර් මාසයේ සිට 2007 දෙසැම්බර් මාසය දක්වා 1500 කට වැඩි පිරිසක් ආගිය අතක් නැතිබව වාර්තාවී ඇත. මේ අය අතුරින් සමහරෙකු මරාදමා ඇති අතර, තවත් සමහරුන් රැඳවුම් කඳවුරුවලදී හමුවී හෝ ආපසු නිවෙස්වලට පැමිණ හෝ ඇති නමුත්, ඔවුන්ගෙන් බහුතරය තවමත් ආගිය අතක් නැත. නමුත් ලැබී ඇති තොරතුරුවලට අනුව ඔවුන්ගෙන් බහුතරය පැහැරගැනගොස් හෝ අතුරුදහන්කර ඇතිබව පෙනීයයි. ශ්‍රී ලංකාවේ ජාතික මානව හිමිකම් කොමිසම (HRC) "අතුරුදහන්වීම්" සම්බන්ධ තම සංඛ්‍යාලේඛන ප්‍රකාශයට පත්නොකරයි. කෙසේ වුවද 2007 මුල් මාස හතර ඇතුලත පමණක් අතුරුදහන්වීමේ සිදුවීම් 300 කට අධික ප්‍රමාණයක් සහ 2006 දී සිදුවීම් 1000 කට අධික ප්‍රමාණයක් ජාතික මානව හිමිකම් කොමිසමට වාර්තා කොට තිබෙන බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් සොයාගන්නා ලදි.

"අතුරුදහන්වීම්" මූලික වශයෙන් සිදුවී තිබෙන්නේ යාපනය, මන්නාරම, මඩකලපුව, අම්පාර සහ වවුනියාව යන සටන් පවතින උතුරු සහ නැගෙනහිර පළාත්වලය. එමෙන්ම "අතුරුදහන්වීමේ" සිදුවීම් ඉතා විශාල ප්‍රමාණයක් කොළඹින්ද වාර්තාවී තිබේ.

## වගකිවයුත්තෝ කවුරුන්ද ?

හියුමන් රයිට්ස් වොච් සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සංවිධාන විසින් ලැයිස්තුගත කරන ලද තොරතුරුවලට අනුව පෙනීයන්නේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා ඃ පාබල හමුදාව, නාවුක හමුදාව සහ පොලීසිය මෙම සිදුවීම්වලින් අති බහුතරයකට සම්බන්ධ බවය. ත්‍රස්ත විරෝධී අණපණත් වලින් අසීමිත බලයක් ලබා සිටින ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදා දෙමළ සන්නද්ධ කණ්ඩායම් සහ ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීත්වයන්ට එරෙහි තම මෙහෙයුම්වලදී, කාලාන්තරයක් මුළුල්ලේම, "අතුරුදහන්කිරීම" සහ සාවද්‍ය මනුෂ්‍ය ඝාතන වැනි නීති විරෝධී ක්‍රියාදාමයන් මත රඳාපවතියි.

හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ලැයිස්තුගත කරන ලද "අතුරුදහන්කරවීමේ" සිදුවීම් කිහිපයකදීම තම ඥාතියා රඳවාගනු ලැබුවේ කවර හමුදා ඛණ්ඩයක් විසින්ද, ඔවුන් රැගෙන ගියේ කවර හමුදා කඳවුරකටද යන තොරතුරු සහ ඇතැම්විට ඔවුන් රැගෙනගිය හමුදා වාහනයේ ලියාපදිංචි අංකය පවා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් දැනසිටියේය.

තවත් ඇතැම් සිදුවීම්වලදී, හමුදා මුරකපොල්ලක් හෝ කඳවුරක් ආසන්නයේ පිහිටි නිවෙස්වලට පැමිණි සන්නද්ධ පුද්ගලයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම් විසින් මෙම පුද්ගලයන් පැහැරගෙනගොස් තිබේ. මෙම කණ්ඩායම් හරියටම කවුරුන්ද යන්න හඳුනාගැනීමට නොහැකිවුවත්, ඇඳිරි නීතිය පවතින වේලාවක විශාල කණ්ඩායම් ලෙසින් සන්නද්ධව නිදහසේ හැසිරීමටත්, හමුදා මුරකපොලු පසුකිරීමටත් ඔවුන්ට අවස්ථාව ලැබීම හමුවේ එයට හමුදාවේ සම්බන්ධයක් තිබිය යුතු බවට ඇසින් දුටු සාක්ෂිකරුවෝ සැකපහලකරති.

තම ඥාතීන් "අතුරුදහන්වීමට" පෙර නිල ඇඳුමින් සැරසුන පොලිස් නිළධාරීන්, විශේෂයෙන්ම අපරාද විමර්ශන ඒකකයේ (CID) සාමාජිකයන්, ඔවුන් අත් අඩංගුවට ගත් බව අතුරුදහන්වූ ඇතැමුන්ගේ ඥාතීහු පවසති. ප්‍රශ්නකිරීම සඳහා ඔවුන් අවශ්‍යව තිබෙන බව පොලීසිය පැවසුවත්, ඔවුන් රැගෙන යන්නේ කොතැනකටද යන්න සඳහන් නොකරන අතර, අත් අඩංගුවට ගත් බව සඳහන් රිසිට් පතක් ලබාදීද නැත. අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව, ඔවුන් සිටින්නේ කොතැනකද යන්න හෝ අත්වූ ඉරණම හෝ පිලිබඳව කිසිවක් සොයාගැනීමට ඥාතීන්ට හැකිවී නැත.

ශ්‍රී ලංකාවේ හදිසි නීති රෙගුලාසි මගින් ආරක්ෂක හමුදාවලට අසීමිත බලතල ලබාදී ඇති අතර, ඔවුන් අධිකරණය හමුවට පමුණුවා දඬුවම් නොකිරීමේ මුක්තියක්ද සලසාදී තිබීම මගින් "අතුරුදහන්කරවීම්" වලට සම්බන්ධවීමට ආරක්ෂක හමුදාවන්ට රුකුල සපයයි. දැනට ක්‍රියාත්මක වන හදිසි නීති විධිවිධාන දෙකේම වගන්ති කිහිපයක් විසින්ම "අතුරුදහන්කරවීම්" වලට රුකුල්දෙන නීතිමය රාමුවක් නිර්මාණය කොට තිබේ. වරෙන්තුවකින් තොරව පුද්ගලයන් අත් අඩංගුවට ගත හැකි අතර, නිශ්චිත නොවන චෝදනා ඉදිරිපත්කොට ඔවුන් රඳවා තබාගත හැකිය. රඳවා ගැනීමට බලයලත් ස්ථාන ප්‍රසිද්ධියට පත්කිරීමද නීතිමය අවශ්‍යතාවයක් නොවේ. එමෙන්ම මහජනතාවට දැනුම්දීමකින් තොරව සහ පශ්චාත් මරණ පරීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමෙන් තොරව මළසිරුරු ඉවත්කර දැමීමට ආරක්ෂක හමුදාවලට අවසර ලැබීම හේතුවෙන් අත් අඩංගුවේ සිටියදී සිදුවන මරණ පිලිබඳව නිසි පරීක්ෂණ පැවැත්වීමේ අවස්ථාවන් වලක්වනලදී.

ස්වාධීනව හෝ ආරක්ෂක හමුදාවල සහාය සහිතව ක්‍රියාත්මකවන ආණ්ඩුවට පක්ෂපාතී දෙමළ සන්නද්ධ කණ්ඩායම්වලටද පැහැරගැනීම් සහ "අතුරුදන්කරවීම්" පිලිබඳව චෝදනා එල්ලවී තිබේ. 2004 දී එල්ටීටීඊ සංවිධානයෙන් වෙන්වීමෙන් අනතුරුව මූලික වශයෙන් නැගෙනහිර පළාතේ සහ කොළඹ ක්‍රියාත්මක වන කරුණා කණ්ඩායම මෙම "අතුරුදහන්කරවීම්" වලට සම්බන්ධ බව අතුරුදහන්වූවන්ගේ ඥාතීහු බොහෝවිට ප්‍රකාශ කලහ. යාපනයේදී සිදුවූ පැහැරගැනීම් ගණනාවක් සම්බන්ධයෙන්ම, කාලාන්තරයක් මුලුල්ලේම එල්ටීටීඊ යේ තර්ජනයට ලක්වී සිටින දෙමළ දේශපාලන පක්ෂයක් වන ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (EPDP) සාමාජිකයන් සම්බන්ධ බව ඇසින් දුටු සාක්ෂිකරුවෝ පැවසූහ.

මෙම කණ්ඩායම් දෙකම ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සමග සහයෝගයෙන් කටයුතු කරයි. එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් හඳුනාගැනීම සහ ඇතැම්විට අත් අඩංගුවට ගැනීම සඳහා හමුදාව සහ පොලීසිය දෙමළ ජාතිකයන් යොදාගන්නා අතර, බොහෝවිට ඔවුන් කරුණා කණ්ඩායමේ හෝ ඊපීඩීපීයේ සාමාජිකයන් බව විශ්වාස කෙරේ. හියුමන් රයිට්ස් වොච් සංවිධානයට වාර්තා කරන ලද සිදුවීම් කිහිපයකදීම, මුලින්ම හමුදා කණ්ඩායමක් පැමිණ තමන් ප්‍රශ්ණකල බවත්, ඉන් පැය කිහිපයකට අනතුරුව, දෙමළ භාෂාව කථාකරන සන්නද්ධ පිරිසක් පැමිණ තම ඥාතියා රැගෙන ගිය බවත් පවුල්වල සාමාජිකයෝ පැවසූහ. තවත් සමහර සිදුවීම්වලදී කරුණා කණ්ඩායම සහ ඊපීඩීපීය එල්ටීටීය සමග පැරණි කෝන්තර පිරිමසාගැනීම සඳහා හෝ කප්පම් ගැනීම සඳහා පැහැරගැනීම් සිදුකොට ඇති බව පෙනීයන අතර, එවැනි අවස්ථාවල ආරක්ෂක හමුදා එවැනි සිදුවීම් නොදන්නා අන්දමින් හැසිරී තිබේ.

ආණ්ඩුවේ පාලනය යටතේ පිහිටි ගැටුම් පවතින ප්‍රදේශවලදී පුදගලයන් පැහැරගැනීම් සම්බන්ධයෙන් එල්ටීටීඊයට චෝදනා එල්ලවී ඇති නමුත් ඒ පිළිබඳව මානව හිමිකම් සංවිධාන සහ මානව හිමිකම් කොමිසමට ලැබී ඇති පැමිණිලි සාපේක්ෂව ඉතා අඩුය. හියුමන් රයිට්ස් වොච් සහ වෙනත් සංවිධාන විසින් වෙනත් අවස්ථාවල පැහැදිලිව දක්වා ඇති පරිදි බෝම්බ ප්‍රහාර, සාමාන්‍ය වැසියන් ඉලක්කකොට එල්ලකරන ප්‍රහාර, ජනසංහාර, වධදීම්, දේශපාලන ඝාතන, එල්ටීටීඊ පාලන ප්‍රදේශවල දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් සංවිධානාත්මකව අහිමිකිරීම සහ එල්ටීටීයේ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් අවධානය පළනොකල යුතු බවක් මෙයින් අදහස් නොකෙරේ. එක් අතෙකින් එල්ටීටීයේ පැහැරගැනීම් අඩුවෙන් වාර්තාවීමට ප්‍රධාන හේතුවක් වනුයේ එය ඔවුන්ගේ මූලික උපායමාර්ගයක් නොවන බැවිනි. එල්ටීටීඊය සාමාන්‍යයෙන් තම විරුද්ධවාදීන් ප්‍රසිද්ධියේ මරාදැමීමට කැමැත්තක් දක්වයි.  ඇතැම්විට එය තම පාලනය යටතේ ජීවත්වන ජනතාව කෙරෙහිද බිය පැතිරවීමේ අරමුණින් කෙරෙන්නක් වියහැකිය. එමෙන්ම එල්ටීටීඊය පිලිබඳව පවතින භීතිය හේතුවෙන් පැහැරගනුලැබූවන්ගේ ඥාතීන් සහ ඇසින් දුටු සාක්ෂිකරුවන් එම සිදුවීම් පිලිබඳව වාර්තාකිරීමට මැලිකමක් දක්වනවාද වියහැකිය.

## පැහැරගැනීම්වල ඉලක්කය කවුරුන්ද?

මෙම "අතුරුදහන්වීම්" වලට වගකිවයුත්තෝ කවුරුන් වුවත්, මුස්ලිම් සහ සිංහල ජාතිකයන්ද පැහැරගෙන ගොස් ඇති නමුත්, එයට ගොදුරුවී ඇති අති බහුතරය දෙමළ ජාතිකයන්ය. එල්ටීටීඊ සංවිධානයේ සාමාජිකයන් හෝ එල්ටීටීය සමග සමීප සම්බන්ධතා පවත්වන්නන් බවට සැකකෙරෙන පුද්ගලයන් ආරක්ෂක හමුදා විසින් ඉලක්ක කරන බවක් දක්නට ලැබේ. දෙමළ තරුණයන් නිරන්තරයෙන් මෙයට ගොදුරුවන අතර, විශ්ව විද්‍යාල සහ පාසල් ශිෂ්‍යයන් විශාල පිරිසක්ද මෙසේ පැහැරගෙන ගොස් තිබේ. ඇතැම් අවස්ථාවල, පූජකයන්, අධ්‍යාපනවේදීන්, සහණ සේවකයන් සහ මාධ්‍යවේදීන් "අතුරුදහන්කරවීම" මගින් ඔවුන්

සමාජයෙන් ඉවත්කිරීම පමණක් නොව එවැනි ක්‍රියාකාරකම්වල නොයෙදෙන මෙන් අනෙක් අයටද අනතුරු ඇඟවීමක් කෙරේ.

උතුරු නැගෙනහිර පළාත්වලදී, බොහෝ "අතුරුදහන්වීම්" සිදුවී තිබෙන්නේ එල්ටීටීඊ ප්‍රහාරයකින් අනතුරුව හමුදාව විසින් වැටලීම් සිදුකරන අතරවාරයේ හෝ ඉන්පසුවය. එවැනි සෝදිසි මෙහෙයුම්වලදී ඇතැම්විට ආරක්ෂක හමුදා විසින් පුද්ගලයන් අත් අඩංගුවට ගෙන ඇති අතර, සමහර අවස්ථාවලදී ඔවුන්ගේ හැඳුනුම්පත් වැනි ලේඛණ තම භාරයට ගන්නා හමුදාව එ'වා යලි ලබාගැනීම සඳහා හමුදා කඳවුරකට හෝ වෙනත් ස්ථානයකට පැමිණෙන මෙන් ඔවුන්ට දැනුම්දී තිබේ. මේ ආකාර දෙකින්ම ආරක්ෂක හමුදා භාරයට පත්වූ ඇතැම් පුද්ගලයන් යලි කිසිදින ආපසු පැමිණ නැති අතර, ඔවුන් සිටින ස්ථානයක් පිලිබඳව හමුදාවෙන් විස්තර දැනගැනීම සඳහා ඥාතීන් දැරූ සියලු උත්සාහයන් අසාර්ථකවී තිබේ.

විශේෂයෙන්ම යාපනයේදී බොහෝ දෙනා "අතුරුදහන්වී" තිබෙන්නේ හමුදා මුරකපොල්ලකදී නතරකරනු ලැබීමෙන් හෝ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයක් හෝ වෙනත් එවැනි සිදුවීමකින් අනතුරුව කෙරෙන සෝදිසි මෙහෙයුමකින් පසුවය. යාපනයේ සිදුකෙරුනු සෝදිසි මෙහෙයුම් කිහිපයකදීම දෙමළ භාෂාව හොඳින් කථාකරන පුද්ගලයන් එයට සහභාගිවී ඇති අතර, ඔවුන්ගේ විලාශය සහ ඔවුන්ගේ මොටර් රථ ඊපීඩීපී කාර්යාල දෙසට ගමන්කළ බැවින් ඔවුන් ඊපීඩීපී සාමාජිකයන් බව අතුරුදහන්වූවන්ගේ ඥාතීහු පවසති.

නැගෙනහිර පළාතේදී, 2006 අග භාගයේදී සහ 2007 මුල් භාගයේදී දහස් ගණන් ජනතාව එල්ටීටීඊයෙන් පළායන අවස්ථාවල සිදුවූ "අතුරුදන්වීම්" පිලිබඳව හියුමන් රයිට්ස් වොච් සංවිධානයට ඇසින් දුටු සාක්ෂිකරුවන් සහ සහණ සේවකයින්ගෙන් ඉතා විශ්වාසදායක තොරතුරු ලැබී තිබේ. ආණ්ඩුවේ පාලන ප්‍රදේශයට පළාඑන එල්ටීටීඊ සාමාජිකයන් යයි සැකකරන පුද්ගලයන් හඳුනාගැනීම සඳහා හමුදාව සහ කරුණා පාර්ශවයේ සාමාජිකයන් ඔවුන් විශේෂ සෝදිසියකට ලක්කළ බව වාර්තාවී තිබේ. මෙවැනි සෝදිසිවල ප්‍රතිඵලයක් වශයෙන් අත් අඩංගුවට ගන්නා ලද දෙමළ තරුණයන් බොහෝ දෙනෙකු ඉන්පසුව "අතුරුදහන්වී" ඇත.

වැරදිකරුවන්ට දඬුවම් නොකිරීමේ පවත්නා වාතාවරණයෙන් ප්‍රයෝජන ගනිමින්, විවිධ කණ්ඩායම් පුද්ගලයන් පැහැරගෙන තම අරමුදල් තරකරගැනීමට උත්සාහ කිරීම හේතුවෙන් 2006 අගභාගයේ සිට කොළඹත් නැගෙනහිර පළාතේ මඩකළපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්කවලත් දේශපාලන අරමුණින් සිදුකෙරෙන "අතුරුදහන්කරවීම්" සහ කප්පම් ගැනීම පිණිස කෙරෙන පැහැරගැනීම් අතර වෙනස හඳුනාගත නොහැකි තරම්වී තිබේ. මෙයින් ඇතැම් පැහැරගැනීම්වලට අපරාධ කල්ලි වගකිවයුතු වියහැකිවුවත්, පොලීසිය නීතිය ක්‍රියාත්මක නොකොට බලාසිටියදී තම කණ්ඩායම්වල නඩත්තුවට අරමුදල් ලබාගැනීම සඳහා කරුණා කණ්ඩායම සහ ඊපීඩීපීය විසින් මේ බොහෝ පැහැරගැනීම් සිදුකරන ලද බවට සාක්ෂි තිබේ.

බලහත්කාරයෙන් තම සංවිධානයට බඳවාගැනීම සඳහා කරුණා කණ්ඩායම විසින් නැගෙනහිර පළාතේදී ළමුන් ඇතුලු පිරිස් පැහැරගත් අන්දම හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් මීට කලින් වාර්තාකොට තිබේ. එවැනි බොහෝ සිද්ධීම්වලදී, තම පුතුන් හෝ ස්වාමි පුරුෂයන් රැගෙන ගියේ යුධ පෙරමුනට බව ඥාතීන් දැනසිටියද, ඉන් අනතුරුව ඔවුන් පිලිබඳ කිසිදු තොරතුරක් ඥාතීන්ට ලැබී නැත.

## දඬුවම් නොලබන අපරාධ

අතුරුදහන්වූ පුද්ගලයෙකු සිටින ස්ථානය හෝ ඔහුට අත්වූ ඉරණම අනාවරණය වනතුරුම පුද්ගලයන් අතුරුදහන්කරවීම නොනවත්වාම සිදුකෙරෙන අපරාධයක් සේ සැලකේ. විශේෂයෙන්ම අතුරුදහන්වූවන්ගෙ පවුල්වල සාමාජිකයන් තම ඥාතියා ජීවතුන් අතර සිටින්නේද නො එසේනම් මියගොස්ද යන්න පිලිබඳව සති, මාස ගණන් හෝ ඇතැම්විට සදාකාලිකව ලතවෙමින් සිටින තත්ත්වයක් තුල මෙම අපරාධයේ බරපතල ස්වභාවය මනාව පැහැදිලි කෙරේ. වධබන්ධනවලට ලක්වූ හෝ ඝාතනය කරන ලද බවට සලකුණුද සහිතව "අතුරුදහන්වූ" ඇතැම් පුද්ගලයන්ගෙ මළසිරුරු හමුවන අතර, තවත් සමහරුන් පොලිස් හෝ හමුදා අත් අඩංගුවේ සිටින බව පසුව අනාවරණය වේ. තවත් සමහරුන් කිසිදින අතුරුදහන්නොවූ බවද අනාවරණය වී තිබේ. එහෙත් "අතුරුදහන්වූවන්" ගෙන් අති බහුතරය යලි කිසිදින නිවෙස් බලා නො එන අතර, අත් අඩංගුවේදී හෝ වෙනත් අවස්ථාවක ඔවුන් මරාදමා ඇතිබව විශ්වාස කෙරේ.

ශ්‍රී ලංකාවේ "අතුරුදහන්කරවීම්" දිගින් දිගටම ක්‍රියාත්මකවීමට රුකුල්දෙන තීරණාත්මක සාධකයක් වන්නේ ආරක්ෂක හමුදා සහ ආණ්ඩුවට පක්ෂපාතී සන්නද්ධ කණ්ඩායම් විසින් සිදුකරන මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් ඔවුන්ට දඬුවම් නොකිරීමේ සංවිධිත ක්‍රියාදාමයයි.

බොහෝ සිදුවීම් පිලිබඳව පොලීසිය තවමත් පරීක්ෂණ නොපවත්වන අතර, පරීක්ෂණ පවත්වන සිදුවීම්වලදීද සැකකරුවන් හඳුනාගැනීමට සහ "අතුරුදහන්වූ" පුද්ගලයන් සොයාගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නැති බව පවසමින් බොහෝවිට එ'වායේ ප්‍රගතිය පිලිබඳව ඥාතීන්ට දැනුම්දීමක් නොකරයි. කෙසේවුවද, මෙම වාර්තාවේ සවිස්තරව දක්වා ඇති පරිදි, පැහැරගැනීම් සඳහා යොදාගත් වාහනයේ අංකය හෝ පැමිණි පුද්ගලයන්ගෙ හෝ හමුදා එ'කකයේ නම වැනි අදාල තොරතුරු ලබාදීමෙන් පසුවත් පොලීසිය නිසි ක්‍රියාමාර්ග නොගන්නා බව ඥාතීහු පවසති.

මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් කටයුතුකළ ආකාරය පිලිබඳව ආණ්ඩුව විසින් නිකුත්කොට ඇති සංඛ්‍යාලේඛණවලට අනුව, වැරදිකරුවන්ට දඬුවම් ලබාදීම සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් පියවර නොගෙන ඇතිබව පැහැදිලිව පෙන්නුම්කෙරේ. ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් 2007

ඔක්තෝබරයේදී හියුමන් රයිට්ස් වොච් සංවිධානයට ලබාදුන් ලේඛණයකට අනුව, 2005-2006 අතර කාලයේදී පැහැදිලිව සඳහන් නොකරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් හමුදා නිළධාරීන් දෙදෙනෙකුට එරෙහිව නඩු පවරා ඇතිබව සඳහන්කොට තිබේ. එමෙන්ම 2007 දී වවුනියාවේදී ශිෂ්‍යයන් පස්දෙනෙකු මරාදැමීම සම්බන්ධයෙන් හමුදා නිළධාරීන් පිරිසකට චෝදනා පත්‍ර භාරදී ඇති බවද එහි සඳහන්ය. එහෙත් එම ලේඛණයේ සඳහන් කිසිදු පියවරක් 2006 මැද භාගයේ සිට සිදුකරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් ගන්නා ලද පියවර නොවේ.

මෑතදී සිදුකරන ලද පැහැරගැනීම් සම්බන්ධයෙන් සැකපිට අත් අඩංගුවට ගෙන ඇතිබව ප්‍රකාශයට පත්වී තිබෙන්නේ 2007 ජුනි මාසයේදී ගුවන් හමුදාවේ හිටපු බලඝණ නායකයෙකුවන නිශාන්ත ගජනායක, පොලිස් නිළධාරීන් දෙදෙනෙකු සහ ගුවන් හමුදාවේ සාජන්වරයෙකු අත් අඩංගුවට ගැනීම පමණි. පුද්ගලයන් පැහැරගනු ලබන්නන්ට එරෙහිව තමන් දැඩි පියවර ගන්නා බව මෙම අත් අඩංගුවට ගැනීම මගින් සනාථකෙරෙන බව පවසමින් ශ්‍රී ලංකා බළධාරීන් එයට ප්‍රබළ ප්‍රසිද්ධියක් ලබාදුන්නත්, 2008 පෙබරවාරි මාසයේ මුල් භාගයේදී එම සැකකරුවන් පිරිස නිදහස් කෙරුනු අතර, ඔවුන්ට එරෙහිව එල්ලකෙරුනු චෝදනා ඉවත්කරගත්තාද යන්න පැහැදිලි නැත.

## ආණ්ඩුවේ ප්‍රතිචාරය

බලහත්කාරයෙන් අතුරුදහන්කරවීමේ සිදුවීම් සොයාබලා එයට සම්බන්ධවූවන්ට දඬුවම් කිරීමට අවංක උත්සාහයක් දරනු වෙනුවට, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව දිගින් දිගටම ප්‍රශ්ණයේ බරපතලකම අවප්‍රමාණ කිරීමට උත්සාහ දරමින් සිටී. ආණ්ඩුවේ බොහෝ නිල ප්‍රකාශණවලට අනුව පුද්ගලයන් "අතුරුදහන්වීමේ" අර්බුදයක් ශ්‍රී ලංකාවේ නොමැති අතර, එසේ තිබෙන්නේනම් එයට වගකිවයුත්තේ එල්ටීටීඊය සහ අපරාධකරුවන් පමණි. පැහැරගැනීම් සහ "අතුරුදහන්වීම්" පිලිබඳව පරීක්ෂණ කිරීමට ආණ්ඩුව විවිධ යාන්ත්‍රනයන් සකස්කොට ඇතත්, නිසි පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය ස්වාධීනත්වය, බලය, සම්පත් සහ අවකාශය ඒ' සියලු යාන්ත්‍රනයන්ට ලබාදී නැත.

"අතුරුදහන්කරවීම්" පරීක්ෂාකිරීම සඳහා යාන්ත්‍රනයන් පිහිටුවා ඉන්පසුව ඒ' සම්බන්ධයෙන් වැඩිදුර පියවර නොගැනීමේ දීර්ඝ ඉතිහාසයකට ශ්‍රී ලංකාව උරුමකම් කියයි. 1980 සහ 1990 දශකවල යුධ ගැටුම් පැවති සමයේ 20,000 ක් පමණ අතුරුදහන්වූ බව,1990 ව දශකයේදී ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් පත්කරන ලද නිල කොමිසම් හතරක වාර්තාවලින් අනාවරණය කරන ලදි. අතුරුදහන්වූ සැබෑ සංඛ්‍යාව එමෙන් දෙගුණයක් හෝ තුන්ගුණයක් පමණ බව මානව හිමිකම් සංවිධානවල මතයයි. සිදුවීම් 2,000 කට අධික ප්‍රමාණයකට වගකිවයුත්තන් මෙම කොමිසම් මගින් හඳුනාගන්නා ලද නමුත්, ඒ' සම්බන්ධයෙන් නඩු පවරන ලද්දේ ඉතාම සුලු පිරිසකට එරෙහිව වන අතර, එහිදී දඬුවම් ලබන ලද්දේත් පහළ මට්ටමේ

හමුදා නිළධාරීන් කිහිපදෙනෙකු පමණි. අනාගතයේදී "අතුරුදහන්කරවීම්" වැලැක්වීම සඳහා කොමිසම් විසින් නිර්දේශ කරන ලද නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ නිසි පරිදි ක්‍රියාවට නැංවීමටද ඉන් අනතුරුව පත්වූ ආණ්ඩුද පියවර ගත්තේ නැත.

2006 මැද භාගයෙන් පසුව "අතුරුදහන්කරවීම්" උත්සන්නවීම සම්බන්ධයෙන් රාජපක්ෂ ආණ්ඩුවේ ප්‍රතිචාරයද පසුගිය ආණ්ඩුවල ප්‍රතිචාරය අනුගමනය කරන්නක් බව පෙනී යයි. පළමුවැන්න, ජාතික මානව හිමිකම් කොමිසමේ සහ පොලිස් කොමිසමේ සාමාජිකයන් ව්‍යවස්ථානුකූලව පත්කරනු වෙනුවට කෙලින්ම ජනාධිපතිවරයා විසින් පත්කිරීම මගින් එම ආණ්ඩුවේ ආයතනවල ස්වාධීනත්වය බරපතල අන්දමින් යටපත්කරන ලදි.

"අතුරුදහන්කරවීම්" සම්බන්ධයෙන් ජාතික මානව හිමිකම් කොමිසමට සියගණනක් පැමිණිලි ලැබී තිබුනත්, එම සිදුවීම් සම්බන්ධයෙන් කොමිසම මෙතෙක් කිසිදු වාර්තාවක් ප්‍රකාශයට පත්කොට නැත. එමෙන්ම තමන්ට ලැබී තිබෙන පැමිණිලි පිළිබඳ සංඛ්‍යාලේඛණ ලබාදීම ප්‍රතික්ෂේපකරන කොමිසම, ප්‍රශ්ණයේ බරපතල ස්වභාවය යටපත් කිරීමට උත්සාහ දරමින් සිටී. ආණ්ඩුවෙන් ප්‍රමාණවත් සහායක් නොලැබීම සහ පරීක්ෂණවලට බාධාකිරීමේ ආරක්ෂක හමුදාවල ආකල්පය හේතුවෙන් මානව හිමිකම් උල්ලංඝණයන් නිරීක්ෂණය කිරීමේ සහ පරීක්ෂණ පැවැත්වීමේ කොමිසමේ අධිකාරී බලයද යටපත්වී තිබේ. කොමිසමේ ස්වාධීනත්වය පැහැරගැනීමට ආණ්ඩුව ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් ජාතික මානව හිමිකම් කොමිසම් පාලනය කරන ජාත්‍යන්තර ආයතනය 2007 දෙසැම්බරයේදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ තත්ත්වය "විශ්ලේෂක" තත්ත්වය දක්වා පහත හෙළීම මගින් කොමිසමේ අසාර්ථකත්වය පිළිබඳ පැහැදිලි ඉඟියක් ලබාදෙයි.

දෙවැන්න, මෙම වාර්තාවේ සවිස්තරව දක්වා ඇති "අතුරුදන්කරවීම්" සහ අනෙක් මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව සොයාබැලීම සඳහා ආණ්ඩුව විසින් තවත් විශේෂ ආයතන නවයක් පිහිටුවා ඇතත්, ඒ කිසිවකින් මෙතෙක් පැහැදිලි ප්‍රතිඵලයක් ලැබී නැත.

මෙම ආයතන පිහිටුවීම පිළිබඳව වරින්වර නිකුත්කෙරෙන ප්‍රකාශණ හැරුනුකොට, එම ආයතනවලට ලබාදී ඇති බළතල හෝ පරීක්ෂණවල ප්‍රගතිය පිළිබඳව ආණ්ඩුව බොහෝවිට තොරතුරු ප්‍රකාශයට පත්නොකරයි. නිරන්තරයෙන් අලුතෙන් ආයතන නිර්මාණය කරනු ලබන්නේ කලින් පිහිටුවන ලද ආයතන ප්‍රශ්ණය සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට අපොහොසත්වූ නිසාද නො එසේනම් නව ආයතන මගින් පවතින යාන්ත්‍රනයන්හි තිබෙන අඩුලුහුඬුකම් නිවැරදි කරන්නේද යන්න පහදාදීමටද ආණ්ඩුව අපොහොසත්වී ඇත.

ආරක්ෂක හමුදා විසින් සිදුකරන මහා පරිමාණ "අතුරුදහන්කරවීම්" සම්බන්ධ වාර්තා පිළිබඳව පරීක්ෂණ ආරම්භකිරීමට නිළධාරීන් මැලිකමක් දක්වන අතරවාරයේ ඒ සම්බන්ධයෙන් රජය බැරෑරුම්ව සලකන බවට ඇඟවීම සඳහා මෙම ආයතන බොහෝමයක්

පිහිටුවා ඇති බව බොහෝ විශ්ලේෂකයන්ගෙ මතයයි. වැරදිකරුවන්ට දඬුවම් ලබාදීමෙහිලා ආණ්ඩුවේ ඉතා අසතුටුදායක වාර්තාව මගින් එවැනි මතයන්ටද විශ්වසනීයත්වයක් ලබාදේ.

පුද්ගලයන් "අතුරුදහන්කරවීමේ" අලුත් අර්බුදයක් නිර්මාණය වී තිබෙන බව සහ මෙම උල්ලංඝනයන්ගෙන් විශාල ප්‍රමාණයකට තම ආරක්ෂක හමුදා සම්බන්ධ බව ආණ්ඩුවේ ඉතා ඉහල මට්ටමේම නායකයන් දිගින් දිගටම ප්‍රතික්ෂේප කිරීමේ වාතාවරණය හමුවේ, පරීක්ෂණවල ප්‍රගතියක් නොමැතිවීම සහ එම උල්ලංඝණ නැවැත්වීමට අපොහොසත්වීම එතරම් විමතියට කරුණක් නොවේ. බොහෝ අතුරුදහන්වීම් "පුද්ගලික කෝන්තරවල ප්‍රතිඵලයන්" සහ අතුරුදහන්වූ අයගෙන් බහුතරය ආපසු පැමිණ ඇති බවට විනිසුරු මහානාම තිලකරත්න කළ ප්‍රකාශ මේ තත්ත්වයට කදිම උදාහරණයක් වන අතර, ඔහුගේ එම ප්‍රකාශ දෙකම සත්‍ය බව සාක්ෂිවලින් තහවුරුවී නැත.

රාජ්‍යයේ ප්‍රතිරූපය කෙලෙසීමේ අරමුණින් කෙරෙන එල්ටීටීයේ මඩ ප්‍රචාර ලෙස හඳුන්වමින් ජනාධිපති රාජපක්ෂ, ආණ්ඩුවේ ඇමතිවරුන් සහ රජයේ සාම ක්‍රියාවලිය සමන්ධීකරන ලේකම් කාර්යාලයේ (SCOPP) ප්‍රධානියා විසින්ද මහා පරිමාණ "අතුරුදහන්කරවීම්" පිලිබඳ වාර්තා බැහැරකරනු ලැබ ඇත. අතුරුදහන්වී ඇති අයගෙන් බොහෝ දෙනෙකු යලි පැමිණ ඇති බවත්, සමහරුන් රට අත්හැරගොස් ඇති බවත් නො එසේනම් අපරාධ පරීක්ෂණවලින් ගැලවීම සඳහා සැඟවී ඇති බව හෝ තම ඥතීන්ටද නොදන්වා නිවෙසින් පිටව ගොස් ඇති බව පවසන ඔවුන් එම තර්ක සනාථකිරීම සඳහා කිසිදු සාක්ෂියක් දක්වා නැත.

ආණ්ඩුවේ නායකයන්ගේ එම අදහස්, පොලිස්පතිවරයා ඇතුලු නීතිය සුරැකීම භාර නිළධාරීන් විසින් කරන ලද ප්‍රකාශත්, ආණ්ඩුවේ ඇතැම් කොමිසම් විසින් නිකුත්කොට තිබෙන සීමිත තොරතුරු හා ජනමාධ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ප්‍රකාශයට පත්කොට ඇති දත්ත සමග නොගැලපේ. අනෙක් අතට "අතුරුදහන්වීමේ" අර්බුදයක් නොමැත්තේනම්, එවැන්නක් පිලිබඳව පරීක්ෂණ පැවැත්වීම සඳහා විවිධ යාන්ත්‍රන ගණනාවක් පිහිටුවීමට ආණ්ඩුව පියවර ගත්තේ මන්දැයි යන ප්‍රශ්ණයක්ද මෙහිදී පැනනගී. "අතුරුදහන්කරවීමේ" ප්‍රශ්ණයක් නැතිබව හුවාදැක්වීමට දැරෙන ඉහලපෙලේ උත්සාහයන් මගින් සිදුකෙරෙන්නේ මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවලට එරෙහිව එල්ලවන චෝදනා ගැන ආණ්ඩුව බරපතල අන්දමින් නොසලකන බවට ආරක්ෂක හමුදාවලට ඉඟිකිරීමකි.

## ජාත්‍යන්තර ප්‍රතිචාරය

2006 මැද භාගයේ සිට ඉතා විශාල පිරිසක් අතුරුදන්වීමේ ප්‍රශ්ණය පිලිබඳව එක්සත් ජාතීන්ගේ විවිධ ආයතන සහ ශ්‍රී ලංකාවේ ප්‍රධානම ජාත්‍යන්තර ආධාරකරුවන් බරපතල අවධානය පලකොට ඇත. ශ්‍රී ලංකාවේ සංචාරය කල මානව හිමිකම් පිලිබඳ මහකොමසාරිස්වරිය, යුධ ගැටුම්වලට මැදිවූ දරුවන් පිලිබඳ විශේෂ උපදේශකවරිය ඇතුලු

එක්සත් ජාතීන්ගේ ඉහලපෙළේ නිළධාරීන් සියලුම දෙනා අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් කිසිවෙකුත් දඬුවම් නොලැබීම සහ වැරදිකරුවන් සොයාගැනීමට නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ ජාතික මානව හිමිකම් කොමිසම අපොහොසත්වීම ගැන ප්‍රබල අවධානය පළකරන ලදි. ඇමෙරිකා එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍යය ඇතුලු විදේශ ආණ්ඩුද මේ පිලිබඳව අදහස් පලකොට තිබේ.

ප්‍රශ්ණය පිලිබඳව ජාත්‍යන්තර විවේචන උත්සන්නවෙද්දී ශ්‍රී ලංකාවේ බළධාරීන් එයට දෙයාකාරයකින් ප්‍රතිචාර දැක්වීය. රටේ මානව හිමිකම් වාතාවරණයේ වර්ධනයක් තිබෙන බව පවසමින්, ජාත්‍යන්තර ආයතන සහ ද්විපාර්ශ්වික හවුල්කරුවන් සමඟ නිරන්තරයෙන් සාකච්ඡා පැවැත්වූ ආණ්ඩුව, එක්සත් ජාතීන්ගේ නිළධාරීන් සහ මානව හිමිකම් සම්බන්ධ විශේෂඥයන් සමඟ සහයෝගයෙන් ක්‍රියාකිරීමට තම කැමැත්ත පලකලේය. එ' අතරවාරයේම රටේ තත්ත්වය පැහැදිලිව වටහාගැනීමට සමත් නොවූ බවටත්, ඇතැම්විට එල්ටීටීඊ ආධාරකරුවන් බවටත් එම එක්සත් ජාතීන්ගේ නියෝජිතයන්ද ඇතුලු තම විවේචකයන්ට ආණ්ඩුව දැඩි විවේචන එල්ලකලේය.

මහා පරිමාණ මානව හිමිකම් උල්ලංඝණයන් පිලිගැනීමට සහ එයට නිසිපරිදි පිලියම් යෙදීමට ශ්‍රී ලංකා ආණ්ඩුව දිගින් දිගටම අපොහොසත්වීම හේතුවෙන් ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊය රටපුරාම සිදුකරන මානව හිමිකම් උල්ලංඝණයන් පිලිබඳව පරීක්ෂණ පවත්වා වාර්තාකිරීම පිණිස මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවියයුතු බවට කෙරෙන ඉල්ලීමට රටතුලින්ම සහ ජාත්‍යන්තරව මතුවන සහයෝගය වර්ධනය වෙමින් පවතී.

මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරියගේ මගපෙන්වීම යටතේ ජාත්‍යන්තර නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාවේ පිහිටුවන මෙන් දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන කරන ඉල්ලීමට යුරෝපා සංගමය සහ මෑතදී එක්සත් ජනපද ආණ්ඩුවද සහාය දැක්වීය. 2007 ඔක්තෝබරයේදී ශ්‍රී ලංකාවේ සංචාරය කළ මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් ලුවිස් ආබර් එවැනි ආයතනයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව සමඟ සහයෝගයෙන් ක්‍රියාකිරීමට තම කැමැත්ත ප්‍රකාශකළේය.

ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයන් පිහිටුවීමේ සෑම යෝජනාවකටම ශ්‍රී ලංකා ආණ්ඩුව මේ වනතුරුම දැඩි විරොධය පලකරමින් සිටී. ශ්‍රී ලංකාවේ සෑම පුරවැසියෙකුගේම අයිතිවාසිකම් ආරක්ෂාකිරීම සඳහා පියවර ගනිමින් සිටින බවට ආණ්ඩුව නගන තර්කය මේ ප්‍රතිචාරය මගින් නිෂේධ කෙරේ.

## ප්‍රධාන නිර්දේශ

- ශ්‍රී ලංකාවේ සිදුවන "අතුරුදහන්කරවීම්" පිලිබඳ ප්‍රශ්ණයේ බැරෑරුම්කම සහ එවැනි සිදුවීම්වලට ආරක්ෂක හමුදා දිගින් දිගටම සම්බන්ධවෙමින් සිටින බව ආණ්ඩුව ප්‍රසිද්ධියේ පිළිගත යුතුය.

"අතුරුදහන්කරවීමේ" ප්‍රශ්ණය බැරෑරුම්ව සලකන තුරු සහ එසේ සලකන බව පෙනෙන්නට තිබෙන තුරු එම ක්‍රියා නැවැත්වීමෙහිලා ශ්‍රී ලංකා ආණ්ඩුව ප්‍රගතියක් නොදක්වනු ඇත. ආණ්ඩුව විසින් නව යාන්ත්‍රනයන් කොතරම් ප්‍රමාණයක් ක්‍රියාවට නැගුවත්, බරපතල ප්‍රශ්ණයක් තිබෙන බව ජ්‍යෙෂ්ඨ නිළධාරීන් පිලිනොගන්නාතුරු එම යාන්ත්‍රනයන්ගෙන් සාර්ථක ප්‍රතිඵල බලාපොරොත්තු වියනොහැකිය. ප්‍රශ්ණයක් තිබෙන බව සහ ආණ්ඩුවේ ආරක්ෂක හමුදා මෙන්ම රාජ්‍යයට අයත් නොවන සන්නද්ධ සංවිධාන එම ප්‍රශ්ණයේ පාර්ශවකරුවන් බව කෙලින්ම පිලිගැනීම අත්‍යවශ්‍ය මුලික අවශ්‍යතාවයකි.

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි සහ විනිවිද පෙනෙනසුලුභාවය සහතිකවන අයුරින් ශ්‍රී ලංකා ආණ්ඩුව පුද්ගලයන් රඳවාගැනීමේ තම ක්‍රියාදාමයන් ප්‍රතිසංස්කරණය කළ යුතුය.

"අතුරුදහන්කරවීම්" අලුත් වටයක් ආරම්භවීම වැලැක්වීම සඳහා අත් අඩංගුවට ගන්නා සියලුම පුද්ගලයන් පිළිගත් රැඳවුම් මධ්‍යස්ථානවල රඳවාගැනීමට සහ එම සෑම ස්ථානයකම රැඳවියන්ගෙ ලැයිස්තුවක් පවත්වාගැනීමට ආණ්ඩුව ක්‍රියාකළ යුතුය. රැඳවියන්ට පවුලේ සාමාජිකයන් සහ තම නීතිවේදීන් බාධාවකින් තොරව හමුවීමට අවසර දියයුතුය. එමෙන්ම, වහාම ඔවුන් විනිසුරුවරයෙකු ඉදිරියට පමුණුවා අත් අඩංගුවට ගැනීමට හේතු සහ චෝදනා ඇත්නම් දැනුම්දිය යුතුය.

- ශ්‍රී ලංකා ආණ්ඩුව "අතුරුදහන්කරවීමේ" සිදුවීම් පිළිබඳව පුලුල් පරීක්ෂණ පවත්වා වැරදිකරුවන්ට දඬුවම් කළයුතුය.

"අතුරුදහන්කරවීමේ" අර්බුදයට වගකිවයුත්තන්ට දඬුවම් නොලැබීම මෙම අර්බුදය දිගින් දිගිටම ඇදීයාමට එක් ප්‍රධාන හේතුවකි. "අතුරුදහන්වූ" පුද්ගලයාගෙ ඉරණම හෝ ඔහු/ඇය සිටින ස්ථානය පැහැදිලිව අනාවරණය කරගන්නා තුරු, මේ වාර්තාවට ඇතුලත් සිදුවීම් ඇතුලු අතුරුදහන්කරවීමේ සහ අඟඹු අත් අඩංගුවට ගැනීමේ සියලුම සිදුවීම් පිළිබඳව බලධාරීන් විසින් පුලුල් පරීක්ෂණ පැවැත්විය යුතුය. ආණ්ඩුවේ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් හෝ නිලනොවන සන්නද්ධ කණ්ඩායම්වල සාමාජිකයන් වුවත්, මේ "අතුරුදහන්කරවීම්" වලට වගකිවයුත්තන්ට තරාතිරම නොබලා දඬුවම් කළයුතුය.

- ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශවයන් විසින් සිදුකරන මානව හිමිකම් පිලිබඳ ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කිරීම් වාර්තාකිරීම සඳහා ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීම පිණිස ආණ්ඩුව සහ එල්ටීටීඊය මානව හිමිකම් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය සමග සහයෝගයෙන් ක්‍රියාකළයුතුය.

පළපුරුදු ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීම මගින් ජීවිත බේරාගැනීමට මෙන්ම උල්ලංඝණයන් වැලැක්වීමට සහ වැරදිකරුවන්ට දඬුවම් පැමිණවීමට අවස්ථාව ලැබේ. මෙහිදී, ආණ්ඩුව සහ එල්ටීටීඊයට පමණක් නොව ජාත්‍යන්තර ආයතනවලටද එහි වගකීම පැවරේ. ජාත්‍යන්තර නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමෙහිලා ශ්‍රී ලංකා ආණ්ඩුවේ ආකල්පය, දිගින් දිගටම සිදුවන උල්ලංඝණයන් වැලැක්වීම සඳහා ව්‍යාජ ක්‍රියාමාර්ග අනුගමනය කරනු වෙනුවට සැබෑ ක්‍රියාමාර්ගයක් ගැනීම පිලිබඳ ශ්‍රී ලංකා ආණ්ඩුවේ කැපවීම පිලිබඳව වැදගත් නිර්ණායකයක් බව ජාත්‍යන්තර මැදිහත්කරුවන් අවධාරණය කළයුතුය. ජාත්‍යන්තර නිරීක්ශණ යාන්ත්‍රනයක් පිලිගැනීම මෙන්ම "අතුරුදහන්වීම්" නිමාකිරීම සහ වැරදිකරුවන්ට දඬුවම් දීම සඳහා ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග මත ශ්‍රී ලංකාවට ලබාදෙන හමුදා සහ අනෙක් මානුෂික නොවන ආධාර රඳාපවතින බව ඉන්දියාව සහ ජපානය ඇතුලු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර හවුල්කරුවන් අවධාරණය කලයුතුය.

විශේශයෙන්ම මහා පරිමාණ "අතුරුදහන්කරවීම්" මැඩපැවැත්වීමෙහිලා ජාත්‍යන්තර නිරීක්ෂණයන් ප්‍රබල දායකත්වයක් සපයන වග සනාථවී ඇති කරුණකි. රැඳවියන් රඳවා සිටින ස්ථානයන් සොයාගැනීම, විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් ගැටුමට අදාල සියලුම පාර්ශවයන්ගෙන් තොරතුරු ලබාගැනීම, පරීක්ෂණ පැවැත්වීම හා පවුලේ සාමාජිකයන් සමග සම්බන්ධතා පැවැත්වීම සඳහා නීතිය සුරකින ආයතනවලට සහායවීම, සහ වාර්තාකරන ලද සිදුවීම් සම්බන්ධයෙන් විශ්වාසනීය වාර්තා රැස්කිරීම ඇතුලු ක්‍රියාමාර්ග මගින් ප්‍රමාණවත් බලයක් සහ පහසුකම් ලබාදුනහොත්, ආණ්ඩුව සහ විවිධ ජාතික ආයතන කරන්නට අපොහොසත්වූදේ ඉටුකිරීමට එම ජාත්‍යන්තර යාන්ත්‍රනයන් සමත්විය හැකිය.

# නිර්දේශ

## ශ්‍රී ලංකා ආණ්ඩුවට ඃ

1. මහා පරිමාණ "අතුරුදහන්කරවීම්" වලට රාජ්‍යයේ වගකීම පිලිගෙන එය නැවැත්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම. හමුදාව සහ පොලීසිය ජාත්‍යන්තර නීතියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරන බව සහතික කිරීම.
2. මානව හිමිකම් ආරක්‍ෂා කිරීම සඳහා ව්‍යවස්ථානුකූලව ලබාදී ඇති සහතිකයන් යටපත්කෙරෙන සියලු නීතීන් අහෝසිකිරීම හෝ සංශෝධණය කිරීම.
3. නිසි අයුරින් චෝදනා ඉදිරිපත්නොකොට අත් අඩංගුවට ගැනීමට හෝ රඳවාගැනීමට අවසර ලැබෙන, ආරක්ෂක හමුදාවලට අසීමිත ආරක්ෂණයක් ලබාදෙන සහ මහජනතාවට දැනුම්දීමකින් තොරව හා පශ්චාත් මරණ පරීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්නොකොට මළසිරුරු විනාශකිරීමට බලය ලැබෙන හදිසි අවස්ථා රෙගුලාසි අවලංගුකිරීම හෝ සංශෝධණය කිරීම.
4. රඳවාගැනීමේ විනිවිදපෙනෙනසුලු භාවය ආරක්ෂාකිරීම සඳහා පියවර ගැනීමඃ
    - ආරක්ෂක හමුදා විසින් අත් අඩංගුවට ගන්නා සියලුම පුද්ගලයන් පිළිගත් ස්ථානවල රඳවාගැනීම හා අත් අඩංගුවට ගන්නා නිළධාරීන් හැඳුනුම්පත් ඉදිරිපත්කොට තමන් හඳුන්වාදීම සහතික කිරීම.
    - රඳවාගැනීම සඳහා වගකිවයුතු ආයතනය, රඳවාගැනීමට හේතුව, අත් අඩංගුවට ගත් දිනය, වේලාව, ස්ථානය, රැඳවියාගේ නම ඇතුලු රැඳවියන්ගේ සියලු විස්තර ඇතුලත් වාර්තාවක් තබාගන්නාමෙන් සියලුම රඳවාගැනීමේ මධ්‍යස්ථානවලට නියෝගකළ යුතුය. රැඳවියාගේ පවුලේ සාමාජිකයන්ට, නීතිවේදියාට සහ අනෙක් අදාල පුද්ගලයන්ට අවශ්‍යවුවිට එම වාර්තා ලබාගැනීමට හැකිවිය යුතුය. රැඳවියන් කඳවුරුවලින් මාරුකරන අවස්ථාවල ඒ' පිලිබඳව පැහැදිලිව සටහන් තැබිය යුතුය.
    - රැඳවියන් වහාම විනිශ්චයකාරවරයෙකු හමුවට ඉදිරිපත්කොට අත් අඩංගුවට ගැනීමට හේතුව සහ චෝදනා තිබේනම් ඒ'වා දැනුම්දිය යුතුය. අත් අඩංගුවට ගැනීම සහ රඳවා සිටින ස්ථානය පිලිබඳව වහාම පවුලේ සාමාජිකයන්ට දැනුම්දිය යුතුය. ආරක්ෂක හමුදා විසින් රඳවාගන්නා ලද ඕනෑම පුද්ගලයෙකුට බාධාවකින් තොරව පවුලේ සාමාජිකයන් සහ නීතිවේදියෙකු හමුවීමට අවසර දිය යුතුය.
    - එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ ජාත්‍යන්තර මානව හිමිකම් නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමට එකඟවී එම යාන්ත්‍රනය සමග සහයෝගයෙන් ක්‍රියාකිරීම
5. අහඹු අත් අඩංගුවට ගැනීම් සහ "අතුරුදහන්කරවීම්" වලට නියෝග දෙන සහ ඒ'වා ක්‍රියාත්මක කරන පුද්ගලයන් සොයාගැනීම සඳහා පරීක්ෂණ පැවැත්වීමට අදාල සියලු පියවර ගැනීම.

- "අතුරුදහන්කිරීම" දඬුවම් ලැබිය හැකි වරදක් බවට පත්කොට එම අපරාධයට අදාලවන පරිදි දඬුවම්ද නියමකිරීම.
- මේ වාර්තාවේ ඇතුලත් වන සිදුවීම් ඇතුලු සියලුම අතුරුදහන්වීම් සහ අහඹු අත් අඩංගුවට ගැනීම් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම. අදාල පුද්ගලයාට අත්වූ ඉරණම හෝ සිටින ස්ථානයක් පැහැදිලිව සොයාගන්නාතුරුම පරීක්ෂණ නොනවත්වාම පවත්වාගෙනයාම සහතික කිරීම.
- මානව හිමිකම් උල්ලංඝණයන්ට සම්බන්ධ හා එ'වාට උපකාර කරන ලද සියලුම දෙනාට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව දඬුවම් දීම හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම.
- තමන්ගෙ යටතේ සිටින සිවිල් හෝ හමුදා නිළධාරීන් අතින් අපරාධයක් සිදුවන බව හෝ සිදුවීමට නියමිත බව දැන දැනම එය වැලැක්වීමට පියවර නොගත් අවස්ථාවල එ' සම්බන්ධයෙන් ඉහල නිලධාරීන්ට දඬුවම් පැමිණවීම.

- "අතුරුදහන්කරවීම්" සහ පැහැරගැනීම්වලට වගකිවයුතු කරුණා පාර්ශවය සහ ඊපීඩීපීය ඇතුලු නිළනොවන සන්නද්ධ කණ්ඩායම්වලට දඬුවම් පැමිණවීම සහ එම සිදුවීම්වලට ආරක්ෂක හමුදාවල සම්බන්ධතාව පිලිබඳ පරීක්ෂණ පැවැත්වීම.

6. පැහැරගැනීම් සහ "අතුරුදහන්කරවීම්" පිලිබඳව නිසි පරීක්ෂණ පැවැත්වීම සඳහා ජාතික මානව හිමිකම් කොමිසම සහ පැහැරගැනීම්, අතුරුදහන්වීම් හා ඝාතන පිලිබඳ ජනාධිපති කොමිසම ඇතුලු ජාතික යාන්ත්‍රනවලට ප්‍රමාණවත් බලතල පැවරීම.

- පැහැරගැනීම්, අතුරුදහන්වීම් සහ ඝාතන පිලිබඳ ජනාධිපති කොමිසමේ (තිලකරත්න කොමිසමේ ) වාර්තාව ප්‍රකාශයට පත්කිරීම.
- ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අදාලව, ජාතික මානව හිමිකම් කොමිසමේ ස්වාධීනත්වය යලි තහවුරු කිරීම. ජාතික මානව හිමිකම් කොමිසමේ පරීක්ෂණවලට සහායදෙන මෙන් හමුදාව සහ පොලීසිය ඇතුලු සියලුම ආණ්ඩුවේ ආයතනවලට දැනුම්දී, එසේ නොකරන්නන්ට දඬුවම් පැමිණවීම.

7. අතුරුදහන්වීම් සම්බන්ධ එක්සත් ජාතීන්ගෙ ක්‍රියාකාරී කණ්ඩායමට ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා ආරාධනා කොට එ' සඳහා කටයුතු පිලියෙල කිරීම.

8. අතුරුදහන්වීමෙන් ආරක්ෂාවීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට අත්සන් තැබීම සහ එය ශ්‍රී ලංකාවේ නීතිගත කිරීම.

## දෙමළ විමුක්ති කොටි සංවිධානයට

1. සියලුම පැහැරගැනීම් සහ නීතිවිරෝධී ඝාතන නවතා දැමීම. පැහැරගැනීම් හා ළමුන් සහ වැඩිහිටියන් බලහත්කාරයෙන් බඳවාගැනීම් ඇතුලු  මානව හිමිකම් උල්ලංඝණයන්ට සම්බන්ධ ඕනෑම සාමාජිකයෙකුට දඬුවම් පැමිණවීම.

2. රැඳවියන්ගේ ඉරණම පිලිබඳව සොයාබැලීම සහ දරුවන් හඳුනාගෙන ඔවුන් මුදවාගැනීම සඳහා යුනිසෙෆ් ඇතුලු ජාත්‍යන්තර සංවිධානවලට එල්ටීටීඊ කඳවුරුවලට ඇතුලුවීමට අවසරදීම.
3. එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ පිහිටුවෙන ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රනයකට සහායදී එය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

## ශ්‍රී ලංකාවට ආධාර කරන රටවලට ඃ

1. ශ්‍රී ලංකාවේ පුද්ගලයන් "අතුරුදහන්කරවීමේ" අර්බුදය සම්බන්ධයෙන් ඒකාබද්ධව දැඩි ප්‍රතිචාරයක් පළකිරීම. ගැටුමට සම්බන්ධ සියලුම පාර්ශවයන් විසින් සිදුකරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් තවදුරටත් ප්‍රසිද්ධියේ හෙලාදැකීම.
2. මහා පරිමාණයෙන් සිදුවන "අතුරුදහන්කරවීමේ" සිදුවීම් නවත්වන මෙන්, එවැනි සිදුවීම් පිලිබඳව පරීක්ෂණ පවත්වන මෙන් සහ වැරදිකරුවන්ට දඬුවම් කරන මෙන් ආණ්ඩුවට බළකිරීම.
3. ආධාර කරන රටවල්, විශේෂයෙන්ම ඉන්දියාව, ශ්‍රී ලංකාවේ දරුණු අන්දමින් බිඳවැටෙමින් තිබෙන මානව හිමිකම් තත්ත්වය පිලිබඳව ශ්‍රී ලංකාවට තම බරපතල අවධානය පළකොට එයට විසඳුමක් දීමේ ජාත්‍යන්තර උත්සාහයන්ට සම්බන්ධ විය යුතුය.
4. ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට මූල්‍යාධාර සපයන හෝ හමුදාවට ආධාර කරන රටවල් "අතුරුදහන්කරවීම්" සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට ආණ්ඩුව දරන අව්‍යාජ ප්‍රයත්නයන් සහ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ යාන්ත්‍රනයක් පිහිටුවීමට එකඟවීම මත ඉදිරියේදී එම ආධාර ලබාදීම තීරණය කළයුතුය.
5. එක්සත් ජාතීන්ගේ අධීක්ෂණය යටතේ මානව හිමිකම් යාන්ත්‍රනයක් පිහිටුවීමට පූර්ණ හා ක්‍රියාකාරී සහයෝගය ලබාදීම. එවැනි යාන්ත්‍රනයක් පිලිගෙන, එය සමඟ සහයෝගයෙන් කටයුතුකරන මෙන් ආණ්ඩුවට සහ එල්ටීටීඊයට බලකිරීම.